


### ඔබ සැමට සුබ නව වසරක්

නව වසරක් එළැඹෙන සැම විටෙකම ජීවිතය පිළිබඳ සුබවාදී බලාපො-රොත්තු රැසකින් අපේ සිත් පිරී යයි. සෑම වසරකම ආරම්භය අපට වැදගත් වන්නේ එනිසා යයි අපට සිතෙයි.

අලුත් අරමුණු රැසක් සමගින් ජීවිතයට මුහුණ දෙන්නට මේ වසරේත් සන්නස පාඨක ඔබ සැමට හැකියාව හා ශක්තිය ලැබේවා යි අපි පතන්නෙමු

ගෙවුණ වසර දෙස ආපසු හැරී බලා අපට වැරදුන තැන් ආවර්ජනය කර එළැඹෙන වසර සාර්ථක කරගන්නේ කෙසේදැයි අපි සිහින මවන්නෙමු ජීවත් වන්නට ඒ සිහිනය අවශ්‍ය ම ය

මේ වසරේත් සන්නස සිය පොරොන්දු ඉටු කරමින් ඔබ සමග ම සිටිනු ඇත  ඒ අපේ සිහිනය යි.






## අනුර හොරේෂස්

# ප්‍රභාකරන්ට 'තුරුම්පු' යොදන දේශපාලන 'කාඩ්' සෙල්ලම

**අනුර හොරේෂස්**

''මොනවද ලංකාවේ වෙන්නේ?'' යුද්දේ එයිද?'' අපේ දෙන්නෙක් ඕස්ට්‍රේලියාවේ කොහේදී හරි මුණ ගැහුනොත් එක සැරේටම අහන්නේ ඔන්න ඔය ප්‍රශ්නේ. පහුගිය අවුරුදු කීපයේදී කවුරුත්වත් ඇහුවේ නෑ යුද්දේ එයිද කියලා. ඒ මොකද? යුද්ධයේ උණුසුමක් ඒ කාලයේ හැමුවේ නැති නිසා. ඒත් දැන් තත්ත්වය වෙනස්. ඒ නිසයි ර විදිහේ ප්‍රශ්න අහන්න සිද්ධ වෙලා තියෙන්නේ. කොහොමද මේ යුද උණුසුම අපට දැනෙන්න පටන් ගත්තේ. ඒ තත්ත්වය මෙහෙම විස්තර කරන්න පුළුවනි.

නොවැම්බර් 18 වැනිදා මහින්ද රාජපක්ෂ රටේ ජනාධිපති වුණා. ඇත්තටම මහින්දට රටේ ජනාධිපති වෙන්න ජනතා විමුක්ති පෙරමුණත්, හෙළ උරුමයත් උදව් කළත් අනියම් ආශිර්වාදය වුණේ ප්‍රභාකරන්ගේ එල්.ටී.ටී.ඊ. සංවිධානයයි. තිත්ත වුණත් ඇත්ත ඒකයි. අපි සත්‍යයට සහ යථාර්ථයට මුහුණ දෙන්න ඕනේ. දිනපු සහ පැරදුන පක්ෂවල ඉන්න දේශපාලනඥයන් කියන කතා පැත්තකට දමලා සිද්ධ වුණේ මොකක්ද කියලා අපක්ෂපාතීව හිතලා බලන්න ඕනේ.

ප්‍රභා කරන්ගේ මහා වීර දිනය නිමිත්තෙන් ලන්ඩන්වල ඉන්න කොටි න්‍යායාචාර්ය ඇන්ටන් බාලසිංහම් ජනාධිපතිවරණයෙන් පස්සේ කිව්වේ මෙහෙම කතාවක්. ''රනිල්ව රටේ ජනාධිපති කළා නම් එයා එලපු සාම උගුලේ අපි තවත් හිරවෙනවා. ලංකාවේ ජනාධිපතිවරණය ළං වෙනකොට ජාත්‍යන්තර බලපෑම මත අපිට අපේ ආයුධත් ආණ්ඩුවට බාර දෙන තත්ත්වයකුයි උදාවෙලා තිබුණේ. උතුර නැගෙනහිර ඡන්ද ටික රනිල්ට වැටුනා නම් රනිල් ජනාදිපති වෙනවා. එයාගේ සාම උගුලේ අපි තවත් හිර වෙනවා. ඒ නිසයා අන්තිම මොහොතේ උතුරු නැගෙනහිර ඡන්ද වර්ධනය කරන්න අපි තීරණය කළේ.''

එහෙම කරපු බාලසිංහම් කතාව අවසාන කළේ මේ විදිහට.

''මහින්ද රාජපක්ෂ කියන්නේ ප්‍රායෝගික නායකයෙක්. ''ඒ තමයි කොටි සංවිධානය මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට දීපු සහතිකය. කොටි ඇයි මහින්දට ඒ විදිහේ සහතිකයක් දුන්-න්. 'ප්‍රායෝගික'' කියන වචනය ආවට ගියාට බාලසිංහම් කියපු වචනයක් නෙමෙයි. ඒකෙන් අදහස් කරන්නේ මහින්ද රාජපක්ෂ හරහා ලංකාවේ වැව්, දාගැබ්, මහා මාර්ග පිළිසකර කර ගැනීම නම් මහින්දට ඒ පැත්තෙන් ප්‍රායෝගික වෙන්න පුළුවන් බව බාලසිංහම් දන්නවා. නමුත් ප්‍රභාකරන් බලාපොරොත්තු වන 'වෙනම රාජ්‍යයක්'' කොයිහැටි වෙතත් ඒකීය රටක් තුළ පෙඩරල් විසඳුමක්වත් ලබා දෙන්නට මහින්දට ජනාධිපතිවරණයේදී සහය දීපූ ජවිපෙත්, හෙළ උරුමයත් කොහෙත්ම ඉඩ නොදෙන බව බාලසිංහම් දන්නවා. ඒ නිසයි බාලසිංහම් මහින්ද හරහා නො-කෙරෙන වෙදකමක් ගැන හිතේ තියාගෙන ''මහින්ද ප්‍රායෝගිකයි'' කියන ........... එක දුන්නේ. ඉන් එහාට සිද්ධ වෙන්නෙ මහින්ද සාමය සොයා යන්නෙ දරන දැවැන්ත උත්සාහ-යයි. ජවිපේ සහ හෙළ උරුමය තමන්ගේ දේශපාලන මතිමතාන්තර ඉදිරියට ගෙන යන්නට කරන මෙහෙයුමයි. මෙම තත්ත්වය ප්‍රයෝජනයට ගනිමින් ප්‍රභා කරන් යුද්ධයකට එළඹෙන්න කරන සැලසුමයි. ඔන්න ඔය කියන කාරණා තුන මුල් කරගෙන තමයි පසුගිය නොවැම්බර් 18 වැනිදායින් පස්සේ ලංකාව හරහා යුදබිය උණුසුම  හමන්නට පටන් ගත්තේ. ''යුද්දේ ආපහු එයිද?'' කියන ප්‍රශ්නය ජනතාව අහන්න පටන් ගත්තේ ඊට පස්සේ. එහෙම ප්‍රශ්නයක් අහන්න ජනාධිපතිවරණයෙන් පස්සේ මොනවද සිද්ධ වුණේ?

මම මේ ලිපිය ලියන්නේ දෙසැම්බර් 31 වැනිදා රාත්‍රියේ. ඒ වෙනකොට මෙන්න මේ වගේ තත්ත්වයකුයි ලංකාවේ තියෙන්නේ. දෙසැම්බර් 04 වැනිදා යාපනය කොණ්ඩාවිල් ප්‍රදේශයේ පුපුරා ගිය ක්ලේමෝ බෝම්බයෙන් සෙබලුන් හත්දෙනෙක් මිය ගියා. දෙසැම්බර් 06 වැනිදා යාපනය ඉරුවාලේ ප්‍රදේශයේ පුපුරා ගිය ක්ලේමෝ බෝම්බයකින් හමුදා ලුතිනන්වරයෙක් සමග සබළුන් හත්දෙනෙ-ක් මරු-මුවට පත්වුණා. නැගෙනහිර පළාතේ කාත්තන්කුඩියේ ප්‍රාදේශීය ලේකම් ඒ.එල්.එම්. පලීල් ඝාතනය කළා. දෙසැම්බර් 03 වැනිදා කොටි පිස්තෝල කල්ලිය මුන්කූර් එජාප සංවිධායක එම්.එච්. හාජා මොහිදීන්ට කෝප්පුර්වලදී වෙඩි තැබුවා. දෙසැම්බර් 03 වැනිදා යාපනයේ ස්ථාන දෙකකදි අත් බෝම්බ ප්‍රහාරයකින් හා වෙඩි තැබීමකින් සෙබලුන් දෙදෙනෙක් මරුමුවට පත්වුණා. ත්‍රිකුණාමලයේ




**සංස්කරණය**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| **NSW** Lakshman Kodituwakku 02 9626 7660 02 9837 5055 | **WA** Kapila Hemantha Balage 08 9456 1972 |
| **QLD** Ananada Samaratunga 07 3372 7953 | **ACT** Asoka Nimalasiri 0439 925 241 |
| **SA** Chandta Eeriyagama 08 8331 2318 | **TAS** Anura Seneviratne 03 6327 4259 |

**සන්නස පිරිවර**

| | |
|---|---|
| අනුර හොරේෂස් | Anura Horetious |
| සිසිර දිසානායක | Sisira Dissanayaka |
| ශ්‍රීනාත් මද්දුමගේ | Srinath Maddumage |
| අසෝක සුබසිංහ | Asoka  Subasinghe |
| සාලිය ගලප්පත්ති | Saliya Galappaththi |
| වි ක ධර්මබන්ධු | W. K. Dharmabandhu |
| ආචාර්ය විද්‍යානි මනතුංග | Dr Vidyani Manathunga |
| ශ්‍රියාණි මද්දුමගේ | Sriyani Maddumage |
| චන්දි මාපා | Chandi Mapa |
| මහින්ද දිසානායක දිවුල්ගනේ | Mahinda Dissanayaka Diwulgane |

සන්නස පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

සන්නස SANNASA
අපේ උරුමය වෙනුවෙන්

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**Sannasa**
PO Box 172  Reservoir
Vic  3073 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel : 03 9310 4196  /0425 720 932
Fax : 03 9310 5569